


වගකීම් සහගතව දිවි තොර කරගැනීම් වාර්තා කිරීම සහ, අර්බුදකාරී තත්වයන්ට දිවි තොර කරගැනීම් හැර වෙනත් විසඳුම් ඉදිරිපත් කිරීම ඔස්සේ, දිවි තොර කරගැනීම් පැතිර යාම අවම කළ හැක. විශේෂයෙන්ම මාධ්‍ය වලට, ආචාර ධාර්මිකව හා ප්‍රවේසම් සහගතව දිවි තොර කරගැනීම් වාර්තා කිරීම ඔස්සේ, මීට සැලකිය යුතු දායකත්වයක් දැක්වීමට හැක.

16 හැවිරිදි පාසල් සිසුවෙකු මිය යෑමේ සිදුවීම, ලංකාදීප පුවත්පත (ජන. 17, 2023) තුළ පළ වී තිබිණි. එම පුවත් වාර්තාව තුළ උල්ලංඝනය වී තිබූ, දිවි තොර කරගැනීම් වාර්තා කිරීම සම්බන්ධ ආචාර ධර්මයන් මෙසේ වෙයි.

1) දිවි තොර කරගත් පුවත පළමු පිටුවෙහි ප්‍රමුඛතාවයකින් යුතුව පළ කොට ඇත.
2) දිවි තොර කරගත් ආකාරය සඳහන් කර ඇත.
3) හැඟීම් කළඹවන සුළු (භාවාතිශය) සිරස්තල යොදාගෙන ඇත.
4) උපකාරක අංක සඳහන් කර නැත.

ඒ අනුව, ලංකාදීප පුවත, දිවි තොර කරගැනීම් පැතිර යෑම වැළැක්වීම සඳහා වගකීම් සහගත දායකත්වයක් ලබාදී ඇතැයි ඔබ සිතන්නේ ද?

උපකාරක අංකයක් පළ කරමු, ජීවිතයක් රැකගනිමු!

හදිසි උපකාරක අංක:
*ශ්‍රී ලංකා සුමිත්‍රයෝ - 0112682535, 0112682570, 0112818860
*1333-CCCline
*ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926

මූලාශ්‍ර:
https://988lifeline.org/wp-content/uploads/2021/04/Lifeline-Papageno-Effect.pdf
https://media.samaritans.org/documents/Media_Guidelines_FINAL.pdf
https://accountablejournalism.org/ethics-codes/australia-standards-of-practice-suicide-reporting